## ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව- 2013

ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 18(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් හරවා එවන ලද රු.1,090,000 ක නිවාස ආධාර ගෙවීම් භාණ්ඩාගාරයෙන් ලැබුණු අග්‍රිම ලෙස සලකා ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට සුපිරි වාසනා ලොතරැයි ප්‍රදාන වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල රු.11,844,054 ක් වුවද එය රු.17,428,500 ක් ලෙස දක්වා තිබීමෙන් ජංගම වත්කම් සහ ආදායම් රු.5,584,446 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 135 හා මුදල් රෙගුලාසි 395(ඌ) | මුදල් පාලනය සම්බන්ධ රාජකාරී කටයුතු නිලධාරීන් කිහිපදෙනෙකු අතරේ බෙදී යන පරිදි සිදුකළ යුතු වුවත්, මුදල් පොත පවත්වා ගැනීම, වැය ලෙජරය නඩත්තු කිරීම, බැංකු සැසඳුම් පිළියෙල කිරීම, චෙක්පත් ලිවීම හා පීඅයිවී පිළියෙල කිරීම යනාදී කාර්යයන් 05 ක් එකම නිලධාරියෙකු විසින් සිදු කර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 540 | දිනපතා ගනුදෙනු අවසානයේ මුදල් පොත තුලනය කර හරි වැරදි බැලිය යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (ආ) සමාජ සේවා අමාත්‍යාංශයේ 2011 අගෝස්තු 29 දිනැති නිවාස ආධාර ලබාදීමේ චක්‍රලේඛය | |
| (i) 1.1 ඡේදය | නිවසක් නොමැති ආබාධිත තැනැත්තන්ට කුඩා ප්‍රමාණයේ නිවසක් තනා ගැනීමට ආධාර ලබාදීම නිවාස ආධාර වැඩ සටහනේ අරමුණ වුවද ඊට පටහැනිව ලබාදී තිබූ රු.250,000 ක |

නිවාස ආධාර මුදල 2014 මාර්තු විගණන අවස්ථාව වන විටත් අදාළ අරමුණ කරා නොයොදා මුතූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවතින බව අනාවරණය විය.

(ii) 3.4 ඡේදය

නිවාස ආධාර හිමිකම් ලැබීමට ඉල්ලුම්කරුගේ මාසික ආදායම රු.6,000 කට වැඩි නොවිය යුතු වුවත් රු.11,400 සිට රු.41,121 ත් අතර මාසික ආදායමක් ලබන ත්‍රස්තවාදී කටයුතු නිසා ආබාධිත වූ පොලිස් නිලධාරීන් 05 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී නිවාස ආධාර ලෙස රු.1,250,000 ක මුදලක් ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.1,508,798 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,621,879 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය සඳහා වූ අතිරික්තයෙහි රු.2,113,081 ක පිරිහීමක් විය. මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම කෙරෙහි සුපිරි වාසනා ලොතරැයි ප්‍රදාන, රු.85,186,955 කින් අඩුවීම සහ ආබාධිතයින් සඳහා ආධාරක උපකරණවලට ගෙවීම් රු.3,813,376 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්මට අනුව ආධාරක උපකරණ ලබාදීම ඉල්ලීම් මත සිදුවන බව දක්වා තිබුණද, ඉල්ලීම් කර තිබුණු ආධාරක උපකරණ 199 ක් ලබා දී නොතිබුණි.

(ආ) ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රවේශ පහසුකම් සැපයීම පිළිබඳ 2006 ඔක්තෝබර් 17 දිනැති අංක 1467/1 දරන ගැසට් නිවේදනය හා 2009 සැප්තැම්බර් 18 දිනැති අංක 1619/24 දරන අති විශේෂ ගැසට් නිවේදනයන් අනුව පවත්නා සියලුම ගොඩනැගිලි, ප්‍රසිද්ධ ස්ථාන හා සේවාවන් සහිත ස්ථාන 2014 ඔක්තෝබර් 16 දිනට ප්‍රථම ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ විය හැකි ආකාරයට සකස් කරනු ලැබිය යුතු වුවත්, විගණිත දිනය වූ 2014 අප්‍රේල් 24 දිනය වන විටත් දිස්ත්‍රික්ක මට්ටමින් අවශ්‍ය තොරතුරු රැස්කර ක්‍රියාත්මක කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් පිළියෙල කර ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි.

(ඇ) ක්‍රීඩා ආධාර හා ආබාධිතයින් පුනරුත්ථාපනය කිරීම සඳහා වූ සංවිධානවලට ආධාර ලබාදීම වෙනුවෙන් රු.300,000 ක් වෙන්කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා කිසිදු මුදලක් වැය කර නොතිබුණි.

(ඈ) 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ සඳහන් ආබාධවලට ප්‍රධාන හේතු මොනවාදැයි සොයා දැන ගැනීම සහ ඒවා වැළැක්වීමේ හා පාලනය කිරීමේ ඵලදායි පියවර ප්‍රවර්ධනය කිරීම හා ආබාධ සහිත තැනැත්තන් සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම යන කාර්යයන් ඉටු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඉ) ආබාධිත පුද්ගලයින් සඳහා රු.3,000 මාසික ජීවනාධාර ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන මාර්තු මාසය වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට යවා තිබුණද, ප්‍රතිලාභීන් ගේ නාම ලේඛන යැවීම ප්‍රමාද වී තිබූ බැවින් 2013 මුල් අර්ධ වර්ෂය සඳහා අදාළ මාසික ප්‍රතිලාභ ලබා ගැනීමට ප්‍රතිලාභීන්ට නොහැකි වී තිබුණි.

**4.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දිරිසවිය වැඩසටහන යටතේ 2012 නොවැම්බර් 30 දින ශ්‍රී ලංකා රජය හා ලෝක බැංකුව අතර ඇතිකරගත් ගිවිසුමේ දෙවන කොටසේ 01 ඡේදය ප්‍රකාරව දිවයිනේ උතුරු ප්‍රදේශයේ තෝරාගත් දිස්ත්‍රික්ක 09 කින් අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයන් 3,060 කට මාසික දීමනා ලෙස එක් පුද්ගලයෙකුට රු. 3,000 ක් බැගින් වර්ෂයකට රු.110,160,000 ක් ආබාධිතලාභියාගේ ගිණුම්වලට බැර කළ යුතු වේ. එම ගිවිසුමේ 03 වන කොටසේ 03 ඡේදය ප්‍රකාරව මෙම කාර්යය 2012 ඔක්තෝබර් ආරම්භ කර 2015 මාර්තු 30 දිනෙන් අවසන් කළ යුතු වුවද, 2013 අප්‍රේල් මාසයේදී ආරම්භ කර එම මාසය සඳහා පමණක් ආබාධිත පුද්ගලයින්ගේ ගිණුම් 1,792 කට රු.5,376,000 ක් බැර කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට බැංකු ගිණුම් 2,963 කට රු.77,214,000 ක් පමණක් බැර කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආරම්භ නොකළ ගිණුම් සංඛ්‍යාව 97 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා මාස 08 ක කාලපරිච්ඡේදයකට අදාළව ආබාධිත පුද්ගල ගිණුම්වලට බැර කරන ලද දීමනා මුදලින් එකතුව රු.7,317,000 ක මුදලක් ගිණුම් අංක නොගැලපීම්, ප්‍රතිලාභියාගේ නම වෙනස්වීම් හා බැංකු ශාඛා සංකේත වෙනස්වීම් යනාදී කරුණු මත ප්‍රතික්ෂේප වී තිබුණි.

**4.3 ප්‍රමාද වූ ව්‍යාපෘති**

ලෝක බැංකු ආයතනය හා ශ්‍රී ලංකා රජය අතර ඇතිකරගත් ගිවිසුම ප්‍රකාර ආබාධිතයින් වෙනුවෙන් වෘත්තීය පුහුණුව හා හැකියාවන් සංවර්ධනය කිරීමේ කටයුතු, 2012 ඔක්තෝබර් මාසයේ ආරම්භ කර 2015 මාර්තු අවසන් කිරීම සඳහා එක්සත් ජනපද ඩොලර් 470,000 ක් වෙන් කර තිබුණද 2014 විගණන අවස්ථාව වනතුරු එම කටයුතු ආරම්භකර නොතිබුණි.

**4.4 අරමුදල් ඌණ උපයෝජනය**

නිවාස ආධාර ගෙවීම සඳහා අරමුදල් උපයෝජනය කර ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබීම හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයේ නිවාස ආධාර ගිණුමේ රු.5,584,446 ක මුදලක් නිෂ්කාර්යව පැවතුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අයවැය ලේඛනමය පාලනය**

අයවැය ලේඛනයේ ඇස්තමේන්තුගත අදායම් හා වියදම්, සත්‍ය අදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 11 සිට සියයට 256 දක්වා පරාසයක් තුළ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

**5.2 නොවිසඳී ඇති විගණන ඡේද**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2011 මැයි 24 දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා වාර්තාවේ 7 ඡේදය ප්‍රකාරව ජංගම ගිණුමේ ඇති අතිරික්ත මුදල් ශේෂය සත් දින තැන්පතුවල ආයෝජනය කිරීමට නියෝග කර තිබුණද 2013 වර්ෂයේදී අතිරික්ත මුදල් එසේ ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 ඔක්තෝම්බර් 12 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීම් තීරණයේ 16 වගන්තිය අනුව නිවාස ආධාර සඳහා වෙනම බැංකු ගිණුමක් විවෘත කරන ලෙස නියෝග කර තිබූ අතර, මේ පිළිබඳ 2012 දෙසැම්බර් 14 දින පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී එම නියෝගය ක්‍රියාත්මක කරන ලෙස අදාළ අමාත්‍යාංශයේ ලේකම් දැනුවත් කළ ද, එසේ නිවාස ආධාර සඳහා වෙනම බැංකු ගිණුමක් විවෘත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) දිරිසවිය වැඩසටහන

(ආ) මුදල් පාලනය

(ඇ) ගිණුම්කරණය

(ඈ) ආධාර ගෙවීම්

(ඉ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම